**හොරණ නගර සභාව**

**කළුතර දිස්ත්‍රික්කය**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූලි 06 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 **මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට හොරණ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත්පාලන දෙපාර්තමේන්තුව මගින් සභාවට ලබාදී තිබූ කැබ් රථය වෙනුවෙන් ගෙවිය යුතු ණය මුදල රු.3,178,456 ක් වුවද, ඒ සඳහා රු.7,000,000 ක් ගිණුම් ගත කර තිබූ අතර ඉකුත් වර්ෂයේ ගෙවා තිබූ රු.706,272 ක් වූ ණය වාරික වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) පුස්තකාල පොත් ඉවත්කිරීම් වටිනාකම වූ රු.34,190 ක් ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමෙන් ඉවත් කළ යුතු වුවද සමුච්චිත අරමුදල් ගිණුම හර කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ගබඩා තොග නිකුත් කිරීම් රු.932,868 ක් සැලසුම් හා උපකරණ ගිණුම හර කිරීම වෙනුවට සමුච්චිත අරමුදල් ගිණුම හර කර තිබුණි.

(ඈ) 2014 වර්ෂයේ මිලදී ගැනීම් වෙනුවෙන් සැපයුම්කරුවෙකුට ගෙවිය යුතු රු.64,950 ක් ණයහිමි ගිණුම බැර කර වැය ගිණුම හර කිරීම වෙනුවට තැන්පතු ගිණුම හර කර තිබූ අතර වාහන අළුත්වැඩියා වියදම් රු.16,576 ක් වැය ගිණුම හර කිරීම වෙනුවට පෙර ගෙවීම් ගිණුම හර කර තිබුණි.

1.3.2 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.28,569,157 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.16,172,065 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.21,315,431 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| ------------------ | -------------------- | ------ | ---------------------- |
| | රු. 000' | රු.000' | රු.000' |
| (i) වරිපනම් හා බදු | 24,946 | 17,600 | 11,551 |
| (ii) බදු කුලී | 6,139 | 9,703 | 1,716 |
| (iii) බලපත්‍ර ගාස්තු | 150 | 150 | -- |
| (iv) වෙනත් ආදායම් | 491 | 488 | 1,147 |

2.2.2 <u>වරිපනම් බදු</u>

සමාලෝචිත වර්ෂය ආරම්භයට වරිපනම් බදු හිඟ ශේෂය රු.8,929,567 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ බිල් කිරීම් රු.21,409,809 ක් විය. 2014 දෙසැම්බර් 31 දින වන විට හිඟ ශේෂයෙන් අයවීම රු.4,767,698 ක්ද, ප්‍රවර්තන අයකිරීම රු.13,933,481 ක්ද විය. ඒ අනුව වරිපනම් බදු අයවීමේ ප්‍රගතිය සියයට 62 ක් විය.

2.2.3 <u>විනෝද බදු</u>

සමාලෝචිත වර්ෂයේ ආරම්භයට පැවති රු.1,092,361 ක් වූ හිඟ විනෝද බදු ශේෂයෙන් 2014 ඔක්තෝබර් 04 දින වන විට අයකරගෙන තිබුණේ රු.27,272 ක් පමණි.

2.2.4 <u>වෙළඳ ස්ථාන කුලී</u>

සමාලෝචිත වර්ෂය අවසානයට පැවති හිඟ වෙළඳ ස්ථාන කුලී ශේෂයෙන් රු.1,388,342 ක් 2015 පෙබරවාරි 20 වන විටත් අයවී නොතිබුණි.

2.3 <u>මෙහෙයුම් සමාලෝචනය</u>

2.3.1 <u>ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නගර සභා ආඥා පනතේ (255) අධිකාරියේ 159(ඊ) වගන්තිය අනුව යම් ආගමික, අධ්‍යාපනික කටයුතු, පුණ්‍ය කටයුතු සහ සුභසාධන කටයුතු සඳහා ආධාර මුදල් ලබාදීමේදී වර්ෂයකට මුළු එකතුව රු.5,000 ක් නොඉක්මවිය යුතු බවත්, එම සීමාව ඉක්මවන්නේ නම් අමාත්‍යවරයාගේ ලිඛිත අනුමැතිය ලබා ගත යුතු බව දක්වා තිබියදී එසේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව සභාවේ සාහිත්‍ය උත්සවය වෙනුවෙන් රු.411,203 ක් වියදම් කර තිබුණි.

(ආ) අය නොවී පවත්නා වූ හිඟ සේවක ණය රු.90,265 ක්ද, කර්මාන්ත බදු රු.10,500 ක්ද, කඩ කුලී රු.4,363,916 ක්ද අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව සභා තීරණ මත කපා හැර තිබුණි.

2.3.2 <u>අවිධිමත් ගනුදෙනු</u>

2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍ය ආයතන චක්‍රලේඛයේ 5.4.4.1 ප්‍රකාරව කිසියම් කාර්යයක් සඳහා ලබා දිය යුතු අත්තිකාරම් මුදල ඇස්තමේන්තුගත වියදමෙන් සියයට 20 කට වැඩි නොවිය යුතු වුවද සභාවේ විදුලි ජනක යන්ත්‍රය අළුත්වැඩියාව සඳහා ඇස්තමේන්තුගත වියදමින් සියයට 50 ක් හෙවත් රු.110,824 ක් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි.

2.3.3 **<u>මෙහෙයුම්/කළමනාකරණ අකාර්යක්ෂමතා</u>**

(අ) 2014 දෙසැම්බර් 31 දිනට අය විය යුතු හිඟ ආදායම් ශේෂය වූ රු.14,414,322 ක් නගර සභා ආඥා පනතේ (255 අධිකාරියේ) 170(අ) හා 170(2) වගන්ති අනුව අයකරගැනීමට ලේකම්වරයා කටයුතු කර නොතිබුණි.

(ආ) මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ 2014 වර්ෂයේ ළමුන් 295 ක් ඉගෙනුම ලැබූ අතර ගුරු මණ්ඩලය 29 ක් සේවයේ යොදවා තිබුණි. පෙර පාසල් ප්‍රඥප්තිය අනුව ළමුන් 20 ක් සඳහා එක් ගුරුවරයෙක් යෙදවිය යුතු වුවත් 2014 වර්ෂයේදී ළමුන් 10 දෙනෙකු සඳහා එක් ගුරුවරයෙකු බැගින් සේවයේ යොදවා තිබුණෙන් අතිරික්ත කාර්ය මණ්ඩලයක් බඳවාගෙන ගෙවීම් කර තිබුණි.

4. **<u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වියදම් පාලනය

(ඈ) වත්කම් කළමනාකරණය